**කොළඹ - කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - 2013**

-----------------------------------------------------------

කොළඹ - කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ චීන එක්සිම් බැංකුව අතර 2009 අගෝස්තු 06 දින එළඹි ණය ගිවිසුම් යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-------------------------------------------------------------------------------

ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වන්නේ පිළිවෙලින් එවකට වරාය හා මහා මාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ මහා මාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය සහ මාර්ග සංවර්ධන අධිකාරිය වේ. පූර්ණ පිවිසුම් පාලනය සහිතව සහ භාවිතා කරනු ලබන්නන්ගෙන් ගාස්තු අයකිරීමේ පහසුකම් සැලසීමේ පදනම මත කිලෝ මීටර් 25.8 ක් පමණ දිගින් යුතු මං තීරු හතරකට බෙදුනු පැයට කිලෝ මීටර් 80 සිට කිලෝ මීටර් 100 ක වේගයකින් ධාවනය කළ හැකි අධිවේගී මාර්ගයක් සැලසුම් කර ඉදිකිරීම කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය ව්‍යාපෘතියේ අරමුණ වේ. ශ්‍රී ලංකා රජයේ අරමුදල් යොදා ගනිමින් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ 2000 ඔක්තෝබර් මාසයේදී මූලිකව ආරම්භ වූ ව්‍යාපෘතිය 2003 ජනවාරි මාසය වන විට අත්හැර දමා තිබුණි. මුල් ඇස්තමේන්තු වටිනාකම වූ රු.මිලියන 9,516 න් සියයට 57 ක් නියෝජනය වු රු.මිලියන 5,444 ක මුදලක්, ඉදිකිරීම් වැඩ නවතා දමන අවස්ථාව වන විට ගෙවා තිබුණි. පසුව, 2008 අගෝස්තු 14 දින පැවැත් වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදි අධිවේගී මාර්ගය ඉදිකිරීමේ වැඩ විෂය පථය කොන්ත්‍රාත්තු හතරකට වෙන් කිරීමටත් එම කොන්ත්‍රාත්තු චීන මෙටලර්ජිකල් සමූහ සමාගමට තනි ව්‍යාපෘතියක් වශයෙන් පිරිනැමීමටත් අනුමැතිය ලබාදී තිබුණි. තවද, 2008 සැප්තැම්බර් 11 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදි අධිවේගී මාර්ගය ඉදිකිරීම සඳහා වූ රු. මිලියන 37,832 කට සමාන එ ජ ඩො මිලියන 292 ක ඇස්තමේන්තුගත මුළු පිරිවැයෙන් සියයට 85 ක් මූල්‍යායනය කිරීම සඳහා රු මිලියන 32,120 කට සමාන එ ජ ඩො මිලියන 248.2 ක ණයක් ලබා ගැනිමට චින එක්සිම් බැංකුව සමග කොන්ත්‍රාත් හතරකට එළඹීමට අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව ණය ප්‍රදානය කිරීමේ නියෝජිතායතනය සමග 2009 අගෝස්තු 06 දින ණය ගිවිසුම් අත්සන් කර තිබු අතර කොන්ත්‍රාත්කරු සමග ඉදිකිරීම් ගිවිසුම් 2008 අගෝස්තු 17 දින අත්සන් කර තිබුණි. 2009 අගෝස්තු 18 දින ව්‍යාපෘතියේ කටයුතු ආරම්භකර තිබූ අතර 2013 අගෝස්තු වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවුවද අධිවේගී මාර්ගය 2013 ඔක්තෝබර් 27 දින මහජනයා සඳහා විවෘත කරන ලදී.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනිම සහ යොදා ගැනිමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරිමත් මෙම වගකීමට ඇතුලත් වේ.

## 2. විගණන විෂයපථය සහ මතය සඳහා පදනම

---------------------------------------------

මාගේ විගණන පරික්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරික්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් සහ ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂාකිරීම්ද, එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු කිරීම පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය දෙනු ලබන නියෝජිතායතනයෙන් ලැබුණු අරමුදල්වලින් ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද වියදම, මූල්‍ය සහ භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව

(ඉ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව.

(ඊ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණේද යන බව හා

(උ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණේද යන බව.

**3. මතය**

**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැටළුවලින් ඇතිවන බලපෑම් හැරුනු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලවී තිබුණු බවත්ය.

**4 මූල්‍ය ප්‍රකාශන**

**4.1 මූල්‍ය කාර්යසාධනය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු 13,453,782,648 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු 47,118,926,777 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| දේපල, පිරියත හා උපකරණ | 44,080,682 | 357,610 | 44,867,611 |
| ව්‍යාපෘති කළමනාකරණය | 210,027,219 | 52,767,765 | 508,774,177 |
| ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් | 231,127,040 | 90,053,482 | 2,500,583,216 |
| කෙරීගෙන යන වැඩ (අධිවේගී මාර්ගය) | 12,733,142,731 | 11,058,849,080 | 42,959,398,096 |
| කෙරීගෙන යන වැඩ ( ගොඩනැගිලි ) | 39,245,172 | - | 39,245,172 |
| උපදේශක සේවා | 196,159,804 | 241,393,079 | 1,022,179,864 |
| මාර්ග සංවර්ධන අධිකාරියට මාරු කරන ලද වත්කම් | 3,878,641 | - | 43,878,641 |
| එකතුව | 13,457,661,289 | 11,443,421,016 | 47,118,926,777 |

**5. විගණන නිරීක්ෂණ**

**5.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ණය ගිවිසුමේ 5 ව්‍යවස්ථාවේ 5.5, 5.6 හා 5.7 ඡේද ප්‍රකාරව ණය කාල පරිච්ඡේදය තුළ ණය නියෝජිතායතනයට ගෙවන ලද රු.85,490,056 කට සමාන එ ජ ඩො 744,574.05 ක් වූ ණය පහසුකමෙන් සියයට 0.3 ක කළමනාකරණ ගාස්තු, රු.84,612,592 කට සමාන එ ජ ඩො 725,252 ක් වූ ණය පහසුකමේ දෛනිකව උපයෝජනය නොකළ කොටස මත වාර්ෂිකව සියයට 0.3 ක බැඳීම් ගාස්තු, රු.84,612,592 කට සමාන එ ජ ඩො 725,252.16 ක් වූ ණය පහසුකමේ උපයෝජනය මත ස්ථාවර රේටය මත සියයට 6 ක ණයකරු අනාවරණ ගාස්තු (Lender Exposure fee) මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට ජපන් යෙන් 45,289,465 කට සමාන රු.57,427,041 ක පිරිවැයකට මිලදී ගත් වාහන 20 ක් දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කරනු වෙනුවට අධිවේගී මාර්ගයේ කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම් ගතකර තිබුණි.

6. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

6.1 අරමුදල් උපයෝජනය

ඉහත 1.2 ඡේදයේ දක්වා ඇති පරිදි අධිවේගී මාර්ගයේ සමස්ත ඉදිකිරීම් කටයුතු කොටස් හතරකට වෙන් කර තිබුණු අතර ඒ අනුව, ණය ගිවිසුම් හා කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර තිබුණි. ණය ගිවිසුම් අනුව එක් එක් කොටස සඳහා අරමුදල් වෙන්කිරීම සහ ඒ මත 2013 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පහත දැක්වේ.

| කොන්ත්‍රාත් අංකය | දාමය (කිලෝමීටර්) | එකඟ වු ණය මුදල | | කොන්ත්‍රාත් වටිනාකම | | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|---|---|
| | | එජඩො | රු. | එජඩො | රු. | එජඩො | රු. |
| I | 0 + 000 සිට 4 + 500 | 70,041,527 | 7,704,567,970 | 82,401,797 | 9,064,197,670 | 70,041,527 | 8,399,101,455 |
| II | 4 + 500 සිට 10 + 900 | 63,573,815 | 6,993,119,650 | 74,792,723 | 8,227,199,530 | 63,573,815 | 7,615,964,831 |
| III | 10 + 900 සිට 16 + 800 | 47,801,344 | 5,258,147,840 | 56,236,875 | 6,186,056,250 | 47,801,344 | 5,724,187,052 |
| IV | 16 + 800 සිට 25 + 800 | 66,783,314 | 7,346,164,540 | 78,568,605 | 8,642,546,550 | 66,783,314 | 7,991,037,936 |
| එකතුව | | 248,200,000 | 27,302,000,000 | 292,000,000 | 32,120,000,000 | 248,200,000 | 29,730,291,274 |

ලැබුණු තොරතුරු අනුව, රු.3,120,000,000 කට සමාන එ ජ ඩො 292,000,000 ක් වූ කොන්ත්‍රාත්තුවල ආරම්භක වටිනාකම රු.41,587,939,430 කට සමාන එ ජ ඩො 345,928,359 ක් දක්වා දෙවාරයක් සංශෝධනය කර තිබුණු අතර, ඒ පිළිබඳ වැඩ විෂය පථයේ විචලනයන් අවස්ථා දෙකකදී 2013 ජූලි 18 සහ 2014 නොවැම්බර් 13 දිනයන්හි අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. එබැවින් කරනලද අතිරේක වැඩ පිරිවැය සඳහා මූල්‍ය සැලසුම් සිදුකර ගැනීම අවශ්‍ය වේ.

**6.2 ඉඩම් අත්පත් කර ගැනීම් හා නැවත පදිංචි කිරීමේ කටයුතු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාර්ග ඉදිකිරීමේ සැලැස්ම අනුව , අධිවේගි මාර්ගයේ ඉදිකිරීම් කාර්යයන් සඳහා ඉඩම් කොටස් 2583 ක් අත්පත් කර ගැනිමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද, 2013 දෙසැම්බර් 31 දක්වා ඉඩම් කොටස් 2,571 ක් පමණක් අත් පත් කර ගෙන තිබුණි. ඉහත දක්වා ඇති පරිදි අත්පත් කර ගත් ඉඩම් කොටස්වලින් ඉඩම් කොටස් 1,251 ක් පමණක් ඉඩම් අත්පත් කර ගැනීම් පනතේ 44 වගන්තිය ප්‍රකාරව ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කර තිබුණි.

(ආ) මෙම ව්‍යාපෘතිය යටතේ අවතැන් වූ පුද්ගලයින් නැවත පදිංචි කිරිම සඳහා පැලියගොඩ මීගහවත්තේ පිහිටි ඉඩමක් අත්පත් කර ගැනීම සඳහා 2001 වර්ෂයේදී රු.1,789,015 ක අත්තිකාරමක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණි. මේ සඳහා ජාතිය ගොඩනැගීමේ බදු හා එකතු කළ අගය මත බදු සහිතව රු.2,641,105 ක ඉතිරි මුදල 2012 ඔක්තෝබර් 12 දින ගෙවා තිබුණි. කෙසේ වුවද එකී ඉඩම පිළිබඳ අයිතිය නාගරික සංවර්ධන අධිකාරියෙන් මාර්ග සංවර්ධන අධිකාරියට 2013 දෙසැම්බර් 31 දක්වාත් මාරු කර නොතිබුණි. මෙම තත්ත්වය මත ඉඩම් කොටස්වල නැවත පදිංචි වූ පුද්ගලයන්ට ඉඩම් අයිතිය මාරුකර ගැනීමේදි ප්‍රමාදයක් ඇතිවී තිබුණි.

(ඈ) 2013 දෙසැම්බර් 31 දිනට වන්දි ගෙවීම් නිරවුල් කිරීමේ ප්‍රමාදයන් මත රු.373,104,216 ක් වූ පොලී ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි. ව්‍යාපෘතිය විසින් වර්ෂ 9 කට වැඩි කාලයක් වන්දි ගෙවීම නිරවුල් කිරීමේ ප්‍රමාදයන් මත ව්‍යාපෘතිය පොලී ගෙවීම් කිහිපයක් කිරීමට සිදු වී තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) 2004 ජනවාරි 21 දින ප්‍රසිද්ධ කරන ලද අංක 1324/19 දරන ගැසට් නිවේදනය යටතේ අත්පත් කර ගත යුතු ඉඩම් කොටස්වලින් ඉඩම් කොටස් 14 ක් එම ඉඩම් වල පෙර අයිතිකරුවන් සමඟ ආරවුල් හේතුවෙන් වර්ෂ 10 කට වැඩි කාලයක් ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවෙන් අත්පත් කරගෙන නොතිබුණි.

**6.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අතුරු ගෙවීම් සහතික අංක 38 හා 39 යටතේ කොන්ත්‍රාත්කරුට ගෙවන ලද රු.2,058,444,793 ක ගෙවීම්වලින් රු.205,844,479 ක් වූ රඳවා ගැනීම් මුදල් ව්‍යාපෘතිය විසින් අයකර ගෙන නොතිබුණි.

(ආ) සපයාගත් තොරතුරු අනුව, අධිවේගී මාර්ගය සඳහා මුහුදු වැලි මුළු අවශ්‍යතාවය ඝන මීටර් 2,550,000 ක් ලෙස තීරණය කර තිබුණු අතර ඝන මීටරයක් එ ජ ඩො 10 බැගින් සමස්ත මුහුදු වැලි අවශ්‍ය ප්‍රමාණය සැපයීමට ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව එකඟ වී තිබුණි. කෙසේ වුවද ඝන මීටරයකට එ ජ ඩො 10 බැගින් එකඟ වූ මිලට ඝන මීටර් 600,000 ක් සැපයීමෙන් පසු ඝන මීටර් 1,150,000 ක් සඳහා ඒකක මිල එ ජ ඩො 11.29 දක්වා හා ඉන්පසු ඝන මීටර් 800,000 ක් සඳහා එ ජ ඩො 11.48 දක්වා වැඩි කිරීමට 2011 ඔක්තෝබර් 21 දින එම සංස්ථාව විසින් තීරණය කර තිබුණි. මිල වැඩිවීම හේතුවෙන් අතිරේක පිරිවැය දැරීමට කොන්ත්‍රාත්කරු එකඟ නොවූ බැවින් මුහුදු වැලි ඝන මීටර් 1,167,478 ක් සැපයීම වෙනුවෙන් ව්‍යාපෘතිය විසින් 2013 දෙසැම්බර් 31 දිනට රු.256,407,720 ක අතිරේක පිරිවැයක් සංස්ථාවට ගෙවා තිබුණි. ඝන මීටරයක් එ ජ ඩො 10 බැගින් වූ පිරිවැයකට මුහුදු වැලි මුළු ප්‍රමාණයම සැපයීම සඳහා පාර්ශවයන් විසින් ආරම්භකව විධිමත් ගිවිසුමක් අත්සන් කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට අයත් මුතුරාජවෙල ප්‍රදේශයේ පිළිවෙලින් අක්කර 55 ක් හා අක්කර 25 ක් වූ ඉඩම් කොටස් දෙකක් කොන්ත්‍රාත්කරුගේ භාවිතය සඳහා කල් බදු පදනමින් 2010 වර්ෂයේදී ව්‍යාපෘතිය විසින් අත්කර ගෙන තිබුණි. කොන්ත්‍රාත්කරු සමඟ එළඹි ගිවිසුම අනුව, ඉහත ඉඩම් වලින් පිළිවෙලින් රු.මිලියන 16.19 ක හා රු.මිලියන 9.34 ක වාර්ෂික බදු කුලී කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රතිපූර්ණය කරගැනීම සඳහා ව්‍යාපෘතිය එකඟ වී තිබුණි. කෙසේ වුවද සංස්ථාව විසින් පසුව වාර්ෂික බදු කුලී ගෙවීම් රු. මිලියන 27 ක් හා රු . මිලියන 14 ක් දක්වා පිළිවෙලින් ඉඩම් අක්කර 55 හා ඉඩම් අක්කර 25 සඳහා වැඩි කර තිබුණි. බදු කුලී ගෙවීම් පිළිබඳව පසුව සිදුවන වැඩිවීම් කොන්ත්‍රාත්කරුගෙන් ඉල්ලීමට ගිවිසුමේ විධිවිධාන නොතිබීමේ ප්‍රතිඵලයක් ලෙස රු.20,338,962 ක බදු සහිත අතිරේක පිරිවැයක් සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය විසින්දරා තිබුණි.

**6.4 මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------**

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2005 ජුලි 01 දිනැති ලිපිය මගින් තනතුරු 21 ක් සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් 73 ක් අනුමත කර තිබුණද 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය සාමාජිකයින් 53 දෙනෙකුගෙන් සමන්විත විය. තවද උපදේශකවරු 4 දෙනෙකු හා ඉඩම් අත්පත් කර ගැනීමේ නිලධාරියෙකු පත්කර තිබුණද, එම තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ වැටුප් හා වාහන ගාස්තු

ලෙස රු.11,938,187 ක මුදලක් ඔවුන්ට ගෙවා තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘති වැඩ පිළිබඳ කාර්යයන්වලට අදාළව සිදුකරන ලද වැඩ පිළිබඳ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 6.5 පරිබාහිර කටයුතු

-------------------

ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ඍජුවම අදාළ නොවන විවෘත කිරීමේ උත්සවයක් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල්වලින් රු.46,393,314 ක මුදලක් ව්‍යාපෘතිය විසින් වැය කර තිබූ බව නිරීක්ෂණය විය.